ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

AA1 විභාගය - ජූලි 2019

## (AA13) ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව

(Economics for Business and Accounting)

---

ව්‍යාපාර හා ගිණුකරණය සඳහා ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු සැපයීමේදී බහුතරයක් විභාග අපේක්ෂකයින් ප්‍රාමාණික මට්ටමින් සාර්ථකව පිළිතුරු සපයා ඇති බව විද්‍යාමාන විය. කෙසේ වෙතත් සමස්තයක් ලෙස ගත්කල සමහර ප්‍රශ්න සඳහා අයදුම්කරුවන් සපයා තිබූ පිළිතුරු වල යම් යම් අඩුපාඩුකම් දක්නට ලැබුනි. ඒ පිළිබඳ උත්තර පත්‍ර පරීක්‍ෂකවරුන්ගේ නිරීක්‍ෂණයන් පහත දැක්වේ:

## A - කොටස

**ප්‍රශ්න අංක 01 - ලකුණු 40**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

සමස්තයක් ලෙස ගත්කල අදාල විෂය නිර්දේශයෙහි වැඩි ප්‍රමාණයක් ආවරණය වන පරිදි මුළු ලකුණු ප්‍රමාණයෙන් 40% ක් සඳහා මෙම කොටස සකස් වී තිබේ. එසේම මූලික ආර්ථික විද්‍යාත්මක න්‍යායයන් සංකල්ප පදනම්කර ගනිමින් විෂය නිර්දේශයේ බරතැබීම් වලට ගැලපෙන ලෙස මෙය සැකසී තිබේ. ප්‍රශ්න අංක 1.1 සිට 1.10 දක්වා දෙන ලද වරණයන් අතුරින් නිවැරදි වරණය තේරීමටත් ප්‍රශ්න 1.11 සිට 1.15 දක්වා යම් ප්‍රකාශයක් ලබා දී එහි සත්‍ය හෝ අසත්‍ය බව දැක්වීමටත් ප්‍රශ්න අංක 1.16 සිට 1.20 දක්වා දෙන ලද පිළිතුරු දෙකක් අතුරින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන මත ලිවීමටත් ලෙස සරල ආකෘතියක් යටතේ මෙම ප්‍රශ්නය සකස්කර ඇත.

මෙම ප්‍රශ්නය සඳහා බහුතරයක් අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා ඉහළ ලකුණු ලබාගෙන තිබුණි. කෙසේ වෙතත් මෙහි සමහර ප්‍රශ්න සඳහා අයදුම්කරුවන්ගේ උත්තරවල අඩුපාඩු නිරීක්‍ෂණය විය.

**<u>අයදුම්කරුවන් සැපයූ පිළිතුරු අනුව පොදුවේ දක්නට ලැබුණු වැරදි / දුර්වලතා කිහිපයක් පහත දැක්වේ:</u>**

**1.1** ඕනෑම සමාජයක අසීමිත මිනිස් වුවමනා සපුරාගැනීමට අවශ්‍ය කරන භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට යොදාගත හැකි ආර්ථික සම්පත් පිළිබඳ දැනුම හා අවබෝධය පිළිබදව මෙම ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වේ. බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ලකුණු ලබාගෙන තිබුණි. භූමිය වෙනුවෙන් කරන ගෙවීම කුලිය ලෙස පිළිතුරු සපයා තිබුණි.

**1.2** ඉල්ලුම යන සංකල්පය යටතේ ඉල්ලුම තීරණය වීමට බලපාන සාධකයන් ගැන අසා තිබුණ මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු සපයා ලකුණු ලබාගෙන තිබුණි.

**1.3** වෙළඳපල ව්‍යුහයන් පිළිබඳ දැනුම හා අවබෝධය බැලීමට මෙම ප්‍රශ්නය මගින් විමසා තිබුණි. නිවැරදි පිළිතුර වූ වෙළෙඳපලට පිවිසීමට බාධා නොමැතිවීම කතිපයාධිකාරි වෙළඳපලක ලක්ෂණයක් නොවන බව සියළුම සිසුන් පාහේ පිළිතුරු සපයා ලකුණු ලබාගෙන තිබුණි.

1.4 පිරිවැය සංකල්පය පිළිබඳ න්‍යායාත්මක දැනුම විමසීමට ලක්කෙරෙන මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් වැරදි පිළිතුරු සැපයීම හේතුකොටගෙන ලකුණු ලබානොගත් බව කිව යුතුය. ඔවුන්ට පිරිවැය සංකල්ප පිළිබඳ අනවබෝධය හේතුවෙන් වැරදි පිළිතුරු සපයා තිබුණි.

1.5 ආයතනයක කෙටිකාලය සම්බන්ධයෙන්ද නිවැරදි ප්‍රකාශය තේරීමට බොහෝ අයදුම්කරුවන් අපොහොසත් විමෙන් අවශ්‍ය ලකුණු ලබාගැනිමට අසමත් වී තිබුණි.

1.6 අයදුම්කරුවන්ගේ ප්‍රායෝගික දැනුම පරික්ෂා කරනු ලබන මෙම ප්‍රශ්නයට ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා වැනි විෂයානුබද්ධ වාර්තා භාවිතා නොකිරීමෙන් නිවැරදි පිළිතුර ලිවීමට බොහෝ සිසුන්ට හැකියාවක් නොතිබිණි.

1.7 ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති සංකල්පය පිළිබඳ නිවැරදි අවබෝධය පරික්ෂා කිරීමට සැපයු ප්‍රශ්නයකි. එහිදී බොහෝ සිසුන් ගුණාත්මක පාලනයන් ලෙස "බැංකු පොලී අනුපාත ප්‍රතිපත්තිය" යන වැරදි පිළිතුරු සැපයීම නිසා ලකුණු ලබාගැනිමට අපොහොසත් වු බව කිව යුතුය. ශිර්ෂ පිළිබඳ උපරිම සීමා යන නිවැරදි පිළිතුර සැපයූ සිසුන් ප්‍රමාණය ඉතා සීමිතය.

1.8 ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයක් නොවන්නේ යන ප්‍රශ්නයට බොහෝ සිසුන් නිවැරදි පිළිතුර වන දෙවන පිළිතුර සපයා ලකුණු ලබාගෙන තිබුණි.

1.9 ආර්ථික පද්ධතියන්හි විවිධ අංශ අතර සම්බන්ධතාවය ජාතික ආදායම් චෘත්තාකාර ප්‍රවාහය මගින් ක්‍රියාත්මක විම පිළිබඳ පරික්ෂා කිරීමට මෙම ජාතික ආදායම් ප්‍රවාහය කාන්දුවිමක් (ගිලිහිමක්) සඳහා උදාහරණ ලෙස "ආනයන" යන්න නිවැරදි පිළිතුර ලෙස සැපයූ සිසුන් ප්‍රමාණය ඉතා සීමිතය. බහුතරයක් සිසුන්ට ලකුණු ලබාගත නොහැකි විය.

1.10 සාර්ව ආර්ථික විචල්‍යයන් පිළිබඳ දැනුම පරික්ෂා කිරීම ඉදිරිපත් කළ මෙම ප්‍රශ්නයට වෙළඳපොල සමතුලිතතාවය යන නිවැරදි පිළිතුරු ලිවීමට බහුතරයක් සිසුන්ට නොහැකි විය.

**1.11 - 1.15** දක්වා දෙන ලද ප්‍රකාශයන්හි සත්‍ය / අසත්‍ය බව සටහන් කිරීමෙන් නිවැරදි පිළිතුරු තෝරාගත යුතුවිය. එම ප්‍රශ්න පහ අතුරින් අයදුම්කරුවන් වැඩි ප්‍රමාණයක් වැරදි උත්තර සපයා තිබුණේ **1.11** සහ **1.13** ටය. එමගින් මුදලේ කාර්යයන් පිළිබඳ දැනුම හා අවබෝධය විමසා බැලීය. **1.13** ප්‍රශ්නයේ ඉල්ලුමේ ආදායම් නම්‍යතාවය සංකල්පය පිළිබඳ පැවති අනවබෝධය හේතුවෙන් නිවැරදි උත්තර සපයා නොතිබුණි.

**1.16 - 1.20** ප්‍රශ්න වලට දෙන ලද උත්තර දෙක අතුරින් නිවැරදි පිළිතුරු තෝරාගත යුතුය. ඉන් වැඩි ප්‍රමාණයක් වැරදි පිළිතුරු තිබුණේ **1.17, 1.18, 1.19** සහ **1.20** යන ප්‍රශ්නවලටය. මෙහිදී පහත සඳහන් විෂය කරුණු පිළිබඳව මනා අවබෝධයක් නොමැති බව අනාවරණය විය:

- නිෂ්පාදිත චක්‍රය.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් බැඳුම්කර විකිණීම මගින් එය මුදල් සැපයුමට බලපාන ආකාරය.
- රජයේ ප්‍රාග්ධන වියදම් හා රටක ව්‍යුහමය වෙනස සඳහා තීරණාත්මක සාධකයන් පිළිබඳව.

## B කොටස

එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 4 කි.

**ප්‍රශ්න අංක 02 - ලකුණු 10**

**(a)** මෙම ප්‍රශ්න මගින් ආර්ථික විද්‍යාවේ මූලික සංකල්පයක් වූ සම්පත් පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලද අතර, මෙම කොටසට බොහෝ අයදුම්කරුවන් නිවැරදි පිළිතුර සපයා ලකුණු ලබාගෙන තිබුණි. එහි II වන කොටසින් පැහැදිලි කිරීමට සැපයූ ලකුණු ලබානොගත් අයදුම්කරුවන් ද බොහෝ වේ. සමහරුන් භූමිය යනු ගොඩනැගිලි, ව්‍යාපාරයන් ලෙස හඳුන්වා ඇති අතර මේවාට ලැබෙන ප්‍රතිලාභ ගැන බොහෝමයක් අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා නොතිබුණි. ව්‍යාපාර කටයුතු සඳහා මිනිස් ශ්‍රමය අවශ්‍ය බවත් ඒවාට ගෙවන ප්‍රතිලාභ ගැන කිසිදු වැටහීමකින් තොරව පිළිතුරු සපයා ඇත.

**(b)** අයදුම්කරුවන් බහුතරයකට මෙම ප්‍රශ්නය අවබෝධ කර ගැනීම අපහසු වූ බව පෙනේ. වෙළඳපල ආර්ථික ක්‍රමයේ ලක්ෂණත්, සැලසුම්ගත ආර්ථික ක්‍රමයේ ලක්ෂණත් ලියා තිබුණි. එම ආර්ථික ක්‍රම මගින් මූලික ආර්ථික ප්‍රශ්න විසඳන අයුරු නිවැරදිව ලියූ පිරිස ඉතාම සුළු කොටසකි.

මූලික ආර්ථික ප්‍රශ්න ධනවාදයේ හා සැලසුම්ගත ආර්ථිකයේ විසඳා තිබූ අයුරු බහුතරයක් අයදුම්කරුවන් ලියා නොතිබුණි. සමහර අයදුම්කරුවන් මූලික ආර්ථික ප්‍රශ්න ගැන පමණක් ලියා ඇත.

**ප්‍රශ්න අංක 03 - ලකුණු 10**

**(a)** මෙම ප්‍රශ්ණයට බොහෝ අයදුම්කරුන් නිවැරදිව පිළිතුරු සපයා තිබුනත්, සමහර සිසුන්ට වීජගණිතමය දැනුම මඳකම ගැටළුව විසඳීමට දරා තිබූ ප්‍රයත්නය අනුව පෙනේ.

**(b)** **(i)** ඉල්ලුම් වක්‍රය පහලට බෑවුම් වන්නේ ඇයි යන්නට සමහර අයදුම්කරුවන් ලියූ පිළිතුරක් නම් "නිපදවන භාණ්ඩ වර්ගය" යාවත්කාලීන නොවීමයි. එනිසා ඉල්ලුම අඩුවන බව සඳහන් කර තිබුණි. ආදායම් ප්‍රතිවිපාකය සහ ආදේශන ප්‍රතිවිපාකය ගැන බොහෝමයක් සිසුන් පිළිතුරු සපයා නොතිබිණි.

**(ii)** අයදුම්කරුවන් බහුතරයක් පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදන අතිරික්තය නිවැරදිව ප්‍රස්තාර ගත කර නොමැති විය.

**ප්‍රශ්න අංක 04 - ලකුණු 10**

**(a)** **(i)** අයවැය හිඟය මුල්‍යනය කිරීමේ ප්‍රභවයන් දෙකක් සඳහන් කිරිමේදී බොහෝ අයදුම්කරුවන් භාණ්ඩාගාර බිල්පත්, සුරැකුම්පත්, බදු ගැන අනවබෝධයකින් පිළිතුරු සපයා තිබුණි.

**(ii)** රාජ්‍ය ව්‍යවසායන්හි වාසි දෙකද නිවැරදිව ලියු අයදුම්කරුවන් ඉතා සුළු ප්‍රමාණයකි. සමහර අයදුම්කරුවන් ලියු පිළිතුරු නම් ් අඛණ්ඩ පැවැත්මක් තිබීම, රජයට ආධාර උපකාර ලැබීම සඳහා යනුවෙන් ද ලියා තිබුණි.

**(b)** බහුතරයක් අයදුම්කරුවන්ට මුදලට ඇති ඉල්ලුම සඳහා වන චේතනා තුන ගැන මනා අවබෝධයක් තිබුණු බව ඉහළ ලකුණු ලබාගැනිම හේතුවෙන් පැහැදිලි විය. සමහර සිසුන් චේතනා තුන නම්කර තිබුණද, ඒවා පැහැදිලි කිරිමට අමතක කර තිබු බැවින් මුළු ලකුණු ලබාගැනිමට නොහැකි විය.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 10**

**(a)** **(i)** නිරපේක්ෂ වාසිය පිළිබඳ නිවැරදිව පිළිතුරු සපයා මුළු ලකුණු ලබාගත් අයදුම්කරුවන් බොහෝවේ. මෙහිදි සමහර සීමිත අයදුම්කරුවන් පිරිසකට සුදු ළූණු සහ ලොකු ළූණු යන භාණ්ඩ දෙක පටලවාගෙන තිබූ නිසා මුළු ලකුණු ලබාගැනීමට නොහැකි විය.

**(ii)** සාපේක්ෂ වාසිය පිළිබඳව නිවැරදිව පිළිතුරු ලිවිමට දී ඇති වගුව අවබෝධ කරගැනිමේ හැකියාවක් නොතිබූ බව පෙනුණි. මේ ගැන අවබෝධය ඉතාමත් දුර්වල බව කිව යුතුය. ගණනය කිරිම නිවැරදිව නොකිරීම නිසා ලබාගත යුතු ලකුණු 04 ම නොලැබී යාමට හේතුවී ඇත.

**(b)** බහුතරයක් අයදුම්කරුවන් ජාත්‍යන්තර වෙළඳාමේ වාසි නිවැරදිව ලියා මුළු ලකුණු ප්‍රමාණයම ලබාගැනිමට සමත් විය.

## C කොටස

**ප්‍රශ්න අංක 06 - ලකුණු 20**

**(A)** **(a)** පාස්කු ඉරිදා සිදුවු ත්‍රස්ත ප්‍රහාරයේ ප්‍රතිවිපාක ගැන සාර්ථකව උත්තර ලියා මුළු ලකුණු ලබාගැනිමට සියලුම අයදුම්කරුවන්ට හැකිවි තිබුණි.

**(b)** වක්‍ර බදුවල අරමුණු ගැන ලිවිමෙදි බදු අයකිරිම ගැන ලියු අයදුම්කරුවන්ද බොහෝවේ. බදු වැඩිකිරීම ජනතාව අපහසුතාවලට ලක්වන බවද ලියා ඇත. මෙම ප්‍රශ්නය තේරුම් ගැනිමට නොහැකි වි තිබුණ බව ලියු පිළිතුරු වලින් මනාව පැහැදිලි විය.

**(B)** අයදුම්කරුවන්ට ජාතික ගිණුම්කරණය පිළිබඳව අවබෝධය පරීක්ෂාවට භාජනය කරන මෙම ප්‍රශ්නයට සම්පූර්ණ ලකුණු ලබාගත් අයදුම්කරුවන් බොහෝවේ. සමහර අයදුම්කරුවන්ට ගණිතමය දෝෂ නිසා ලකුණු ලබාගැනීමට නොහැකි වී ඇත. නිෂ්පාදිත මත බදු සහ සහනාධාර වැනි කොටස් හසුරුවා ගැනීමට සමහර සිසුන්ට අවබෝධයක් නොමැති වී තිබීම ගැනද සඳහන් කළ යුතුව ඇත. සහනාධාර හා බදු යන දෙකම එකතු කිරීම, වක්‍ර බදු වෙනුවට සහනාධාර ගලපා තිබීම වැරදි ලෙස සිදුකර ඇත.

**(C)** ජාතික ගිණුම් පිළියෙල කිරීමේ ඇති වැදගත්කම ගැන ලිවීමේදී, සීමිත අයදුම්කරුවන් ප්‍රමාණයක් පමණක් නිවැරදි උත්තර සපයා මුළු ලකුණු ප්‍රමාණයම ලබාගෙන තිබුණි. රටතුළ කුමන ක්ෂේත්‍රවලට කුමන අයුරින් මුදල් කොපමණ ප්‍රමාණයක් යෙදවීම කළ යුතුද යන්න සහ අවශ්‍ය ප්‍රතිපාදන පිළිබඳවද මෙම ප්‍රශ්නයට නොගැලපෙන ආකාරයෙන් සීමිත අයදුම්කරුවන් පිරිසක් උත්තර ලියා තිබුණි.

\- - -

__විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:__

1. විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

2. ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති උත්තර පිළිබඳව නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.

3. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථන වලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

4. මෙම විෂයට අදාල ස්ව-අධ්‍යයන පාඩම්මාලාව, ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, මහ බැංකු වාර්තා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.

5. උත්තර ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

6. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

7. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

8. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

9. ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුළින් එකිනෙක සංකල්ප අතර ඇති වෙනස සන්සන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

10. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

11. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

12. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

\- * * * -